ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2024.07.22

පැමිණිලි පාර්ශවය : ඩී.ජී. ලොකුබාලසූරිය මිය,
පහුරුවල වත්ත,
ලේල්කඩ,
ගිණිවැල්ලගහ.

වගඋත්තර පාර්ශවය : විදුහල්පතිනිය,
ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය,
ගාල්ල.

පැමිණිලි අංකය : **HRC/1403/24**

**පැමිණිලිකාරියගේ පැමිණිල්ල සහ පැමිණිල්ල මඟින් ඉල්ලා සිටින සහනය**

පැමිණිලිකාරියගේ දියණිය වන සෙතිනි දහම්සා ජයසේකර ශිෂ්‍යාව 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වගඋත්තර පාසලේ අධ්‍යාපනය ලැබූ බවත්, 2024 වර්ෂයේ ජනවාරි මස පවත්වන ලද 2023 අ.පො.ස. උසස් පෙළ විභාගයට කලා අංශයෙන් පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන බවත්, 2024 වර්ෂයේදී පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර සඳහා අයදුම්කර, සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව පාසල් කළමනාකරණ කමිටුව විසින් පැමිණිලිකාරියගේ දියණිය ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර සඳහා නම් කර තෝරාගෙන තිබියදී නව විදුහල්පතිතුමිය පාසලේ වැඩ භාරගැනීමෙන් අනතුරුව 2024.03.15 දින ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර 12 ශ්‍රේණියට විවෘත කරමින් ශිෂ්‍ය නායිකා තනතුරුවලට ඉදිරිපත් වූ සියලුම දරුවන් සඳහා ගුරුවරුන්ගේ ඡන්ද විමසීමක් පවත්වන ලද බවත්, ඒ අනුව පාසල් කළමනාකරණ කමිටුව මඟින් ගන්නා ලද තීරණය නොසලකා කටයුතු කිරීම හරහා තම දියණිය බලවත් අසාධාරණයකට පත්වූ බවත්, මේ සම්බන්ධව සලකා බලා තම දියණියට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලා පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම

වගඋත්තර පාර්ශවය විසින් 2024.05.06 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාව මඟින් පහත කරුණු දක්වා ඇත.

2024.03.15 දින පවත්වන ලද ගුරු මණ්ඩල රැස්වීමේදී ශිෂ්‍ය නායිකාවන් පිළිබඳ ගුරුවරුන්ගේ කැමැත්ත සහ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලද්දේ ගුරුවරුන් විසින් විවිධ අවස්ථාවල ශිෂ්‍ය නායිකා මණ්ඩලය තේරීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද විවිධ අක්‍රමිකතා සැලකිල්ලට ගනිමින් වන බවත් වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර සිටී.

එම ඡන්ද විමසීම සඳහා ගුරුවරුන් 81ක් ඡන්දය භාවිතා කල බවත්, විදුහල්පතිතුමිය ඇතුළු අලුතින් පාසලට පැමිණි නියෝජ්‍ය විදුහල්පතිවරුන් තිදෙනෙක් එම ශිෂ්‍යාවන් පිලිබඳ තොරතුරු නොදන්නා බැවින් ඡන්දය ලබා දීමෙන් වැලකී සිටි බවත්, ශිෂ්‍ය නායිකා මණ්ඩලය තේරීම විනිවිද භාවයෙන් තොර බව සඳහන් කරමින් ආචාර්ය මණ්ඩලයේ කිහිපදෙනෙක් ද ඡන්දය දීමෙන් වැළකී සිටි බවත් දක්වා ඇත.

අදාල සම්මුඛ පරීක්ෂණය තමා විදුහල්පති ධූරය භාර ගැනීමට පෙර සිදු කර ඇති බවත්, තමා විදුහල්පති ධූරයේ රාජකාරි භාර ගෙන කෙටි කාලයක් වන බැවින්ද සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී ඇති ශිෂ්‍ය නායිකාවන් පිලිබඳ පූර්ණ අවබෝධයක් නොමැති බැවින් ද එම ශිෂ්‍ය නායිකාවන් අතරින් වඩාත් ගැලපෙන ශිෂ්‍ය නායිකාවන් ගුරුවරුන්ගේ මනාපය අනුව ප්‍රධාන තනතුරු සඳහා තෝරා ගන්නා ලෙසත්, විරෝධතා ඇති ශිෂ්‍ය නායිකාවන් සිටී නම් සටහන් කරන ලෙසත් ඉල්ලා සිටින ලද බවත්, ඒ අනුව වැඩිම මනාප හිමි ශිෂ්‍යාවන් සඳහා තනතුරු පිරිනැමීමට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ එකඟතාවය පල වී ඇති බවත් දක්වා ඇත.

කොරෝනා වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් පාසලේ ශිෂ්‍ය නායිකා නිල ලාංඡන පැළඳවීමේ කටයුතු සිදු නොවීම නිසා මේ දක්වා ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ලෙස 2022 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිට 2023 වර්ෂයේ දෙවන වර උසස් පෙළ විභාගයට පෙනී නොසිට දැනට 2024 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට අපේක්ෂාවෙන් සිටින ශිෂ්‍යාවක් කටයුතු කරන නමුත් ගුරු මණ්ඩලයේ අවශ්‍යතාවය වූයේ දැනට පාසලේ නාම ලේඛනයේ පැමිණීම සටහන් වන ශිෂ්‍යාවකට ප්‍රධාන ශිෂ්‍ය නායිකා ධූරය ලබා දීම බවද වගඋත්තර පාර්ශවය ඉදිරිපත් කරන ලද වාර්තාව මඟින් දක්වා ඇත.

පැමිණිලිකාරියගේ දියණිය සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ විරෝධතා එල්ල වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඇය විසින් විවිධ සමාජ මාධ්‍ය ජාලා වල පල කර ඇති ඡායාරූප සහ විවිධ ප්‍රකාශ ශිෂ්‍යාවකට ඔබින නොවූ බැවින් බවත්, අදාල whatsapp status සහ ඡායාරූප වගඋත්තරකරු ඇතුළු පාසලේ බොහෝ ගුරුවරුන්ගේ ජංගම දුරකථන හරහා දර්ශනය වූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව බාලිකා පාසලක ඉහල තනතුරකට පත් කිරීමේදී එහි උචිත අනුචිත බව ඉහල කළමණාකරන කමිටුවෙන් ද විමසීමට ලක් කරන ලද්දේ ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර පැමිණිලිකාරියගේ දියණියට ලබා දීම ගැටළු සහගත තත්ත්වයක් නිර්මාණය වීමට මගපෑදිය හැකි බැවින් බවත් දක්වා ඇත.

තවද කොරෝනා වසංගතය සමඟ ශිෂ්‍ය නායිකාවන් තේරීම එක් එක් වර්ෂයට අදාළව ක්‍රමානුකූලව සිදුව නොමැති බැවින් කාලයත් සමඟ ඉදිරියට ආ මෙම තෝරා පත් කර ගැනීම සම්පූර්ණයෙන් විධිමත් නොවන

බව කළමණාකරණ කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද බවත්, අදාළ වර්ෂවලදී ඒ ඒ වයස් කාණ්ඩවලට අවස්ථාව ලබාදිය යුතු නිසා 13 ශ්‍රේණියේ දියණිවරුන්ට අවස්ථාව ලබා දුන්නද ඔවුන් 2023 (2024) වර්ෂයේ අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසු වන දියණිවරුන් බවත් දක්වා ඇත.

එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පාසල් ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරා ගැනීම පිළිබඳ උපදෙස් සංග්‍රහයේ දක්වා ඇති පරිදි පාසල් අධ්‍යාපනය හදාරන කාල සීමාව තුළ දී පමණක් ශිෂ්‍ය නායක මණ්ඩලයට නායක නායිකාවන් තෝරා පත් කර ගත යුතු බවත් වගඋත්තර පාර්ශවය විසින් අවධාරණය කර ඇත.

<u>පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු</u>

වගඋත්තර පාසලේ විදුහල්පතිනිය ප්‍රකාශ කරන ලද්දේ 2024.02.28 දින තමා විදුහල්පති ධුරයේ වැඩ බාර ගන්නා අවස්ථාව වන විට ශිෂ්‍ය නායිකා මණ්ඩලය තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර තිබූ බවත්, තමා හට පැවරී තිබුනේ අදාළ සිසුවියන් ඡන්දයකට ඉදිරිපත් කිරීම පමණක් බවත් ය.

4 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්ගෙන් ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා දරුවන් තෝරා ගන්නා බවත්, එම දරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර වැඩි ලකුණු ලබාගත් දරුවන් දරුවන් ඡන්දය සඳහා යොමු කළ බවත් වගඋත්තර පාර්ශවය සඳහන් කරන ලදී.

පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා යෝජනා වී තිබෙන දරුවන් සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ වාචික විරෝධතා එල්ල වූ බැවින් ඡන්ද විමසීමකට යොමුවූ බවත්, අදාළ ඡන්ද විමසීම පිළිබඳව ඡන්දය පැවැත්වීමට පෙර දිනයේ එනම් 2024.03.14 දින ගුරුවරුන් දැනුවත් කළ බවත්, ඡන්ද විමසීම පැවැත්වෙන අවස්ථාවේදී ගුරුවරුන් 81ක් ඒ සඳහා සහභාගී වූ බවත් වගඋත්තර පාර්ශවය විසින් ප්‍රකාශ කරන ලදී.

පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර සිටියේ අදාළ ඡන්ද විමසීම සිදුවන අවස්ථාවේදී සියලු ගුරුවරුන් පාසලේ නොසිටි බවත්, ප්‍රාථමික අංශයේ බොහෝ ගුරුවරු නොසිටි බවත්, සමහර ගුරුවරු දරුවන් සමඟ නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා පිටියට ගොස් සිටි බවත් ය. තවද මුල් අවස්ථාවේදී මෙය ඡන්ද විමසීමක් ලෙස නොව ගුරුවරුන්ගේ විරෝධතා ප්‍රකාශයක් ලෙස පමණක් සිදුකරන බවට දන්වා තිබුණු නමුත් ඡන්දය සිදුවන අවස්ථාවේදී ඡන්ද පත්‍රිකා බෙදමින් කටයුතු කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා පත්කිරීමේදී ප්‍රධාන ශිෂ්‍ය නායිකා - තනතුරු 1, උප ප්‍රධාන ශිෂ්‍ය නායිකා - තනතුරු 2, අධි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායිකා - තනතුරු 2, ක්‍රීඩා නායිකා - තනතුරු 1, උප ක්‍රීඩා නායිකා - තනතුරු 1 වශයෙන් තනතුරු වර්ගීකරණය කර ඇත.

ඉහත තනතුරු අතරින් ක්‍රීඩා නායිකා සහ උප ක්‍රීඩා නායිකා තනතුරු හැර අනෙකුත් තනතුරු සඳහා ඡන්ද විමසීම පවත්වන ලද බවට දියණිය විසින් ප්‍රකාශ කළ අතර, එම ඡන්ද විමසීමට 2023,2024,2025 වර්ෂවල උසස් පෙළ සඳහා පෙනී සිටීමට නියමිත දරුවන් 25 දෙනෙකු පමණ පාසලේ වේදිකාව මතට ගෙන්වූ බවත්, එහිදී ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර සඳහා 12 ශ්‍රේණියේ දරුවන්ට පමණක් ඡන්දය භාවිතා කරන ලෙස විදුහල්පතිතුමිය සහ නියෝජ්‍ය විදුහල්පතිතුමිය විසින් දන්වන ලද බවත්, එම ඡන්ද විමසීමේදී පැමිණිලිකාරියගේ දියණියට තුන්වැනියට වැඩිම ලකුණු හිමිව තිබූ නමුත් ඉහත දක්වා ඇති තනතුරු අතරින් කිසිදු තනතුරක් හිමි නොවූ බවත් දියණිය විසින් ප්‍රකාශ කරන ලදී.

එම ඡන්ද විමසීමේදී වැඩිම ලකුණු ලබා ගත් හෂාරා නවින්දුනි ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ලෙසත් උප ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුරු සඳහා සෙනුපමා උඩුගම්පල සහ ගයත්මි ගිම්හාරා යන ශිෂ්‍යාවන් තෝරා ගත් බවත් වගඋත්තරකාරිය ප්‍රකාශ කරන ලදී.

තමා විදුහල්පතිනිය ලෙස වැඩ භාර ගැනීමට පෙර වැඩ බලන විදුහල්පතිනිය වශයෙන් කටයුතු කල විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරියගේ දියණිය ඇතුළු ප්‍රධාන ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරා පත්කර ගැනීම සඳහා පාසල් කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද දියණියන් පිළිබඳව තමා දැනුවත් කර නොතිබුණු බවත්, කළමණාකරණ කමිටු වාර්තාවල සඳහන් පරිදි ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ තනතුරු සඳහා පත්කරන ලද දියණියන් පිළිබඳව තමා දැනුවත් වූයේ ශිෂ්‍ය නායිකාවන් තෝරා පත් කිරීම සඳහා ඡන්ද විමසීම පැවැත්වීමෙන් අනතුරුව බවත්, තමාට පෙර වැඩ බලන ලද විදුහල්පතිනිය විසින් ශිෂ්‍ය නායිකාවන් පත් කිරීම සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ පිළිබඳව තමා දැනුවත්ව නොසිටි බවත් වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කරන ලදී.

ඡන්දය පවත්වා ලකුණු ලබා ගත් පිළිවෙලට ශිෂ්‍ය නායක මණ්ඩලය නම් කර 2024.05.21 දින ශිෂ්‍ය නායක මණ්ඩලයේ පදක්කම් පැළඳවීමේ උත්සවය පැවැත්වීමට තීරණය කරගෙන තිබුණු නමුත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ පැමිණිලි හේතුවෙන් එම උත්සවය කල් දමන ලද බවත් ප්‍රකාශ කරන ලදී.

පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා සිටින ප්‍රධාන ශිෂ්‍ය නායිකා ධූරය ලබා දීම පාසලේ මින් ඉදිරියට සංස්කෘතියක් බවට පත් නොවී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද සඳහනක් අනුව යම් කිසි කාල සීමාවකට යටත්ව ලබා දීමට එකඟ වන බවට වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කරන ලදී.

<u>වගඋත්තර පාසලේ වැඩබලන විදුහල්පතිනියගේ කරුණු දැක්වීම</u>

වගඋත්තර පාසලේ වැඩබලන විදුහල්පතිනිය ලෙස කටයුතු කළ එන්.බී.එම්. මැන්දිස් මහත්මිය විසින් 2024.05.16 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් වෙත යොමු කර ඇති ලිඛිත කරුණු දැක්වීම අනුව,

වර්තමාන විදුහල්පතිනිය 2024.02.28 දින රාජකාරි භාරගන්නා විට ශිෂ්‍ය නායක මණ්ඩලය තේරීමේ සම්මුඛ පරීක්ෂණ අවසන් වී නොතිබුණු බවත්, විදුහල්පතිනිය වැඩ භාරගෙන දින කිහිපයක් ගත වන තුරු එම කටයුතු සිදුවූ බවත්, ක්‍රමවේදයේ ගැටලුවක් පැවතියේ නම් විදුහල්පතිනියට එම කටයුතු නතර කර නැවත සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමේ හැකියාවක් තිබූ බවත් සඳහන් කර ඇත.

තවද විදුහල්පතිනිය විසින් සඳහන් කරන ආකාරයට පැමිණිලිකාරියගේ දියණිය ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර සඳහා සම්මත වී පැවති බව ඇය නොදැනුවත්ව සිට ඇති නමුත් වත්මන් විදුහල්පතිනිය වැඩ භාරගත් 2024.02.28 දින පාසලේ සියලු බඩු භාණ්ඩ සමඟ වැදගත් ලේඛන තමා භාරදුන් බවත්, එහිදී කළමනාකරණ කමිටු වාර්තා පොත ද වත්මන් විදුහල්පතිනියට භාරදුන් බවත්, ශිෂ්‍ය නායක මණ්ඩලය පත්කිරීමට පෙර පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ද තමා වාචිකව අදාළ කළමනාකරණ කමිටු වාර්තාවල සඳහන් කරුණු පිළිබඳව වත්මන් විදුහල්පතිනිය දැනුවත් කළ බවත්, ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුර සඳහා පත්කිරීමට කළමනාකරණ කමිටුව විසින් අනුමත කර තිබූ බවත්, ඒ බව සනාථ කිරීමට කළමනාකරණ කමිටු රැස්වීම්වල පටිගත කිරීම් ඉදිරිපත් කළ හැකි බවත් දක්වා ඇත.

## නිරීක්ෂණ

1. 2024 වර්ෂය සඳහා ගාල්ල ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය පත්කිරීමේදී තම දියණිය ප්‍රධාන ශිෂ්‍ය නායක ධූරය සඳහා පත්කිරීමට පාසලේ කළමනාකරණ කමිටුව විසින් යෝජනා කර තිබියදී වගඋත්තර පාර්ශවය විසින් එම තනතුර ලබා නොදුන් බව සඳහන් කරමින් පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

2. ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා දරුවන් තෝරා ගැනීමේදී 4 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වන ශිෂ්‍යාවන් සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කර ඇති අතර, අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ශිෂ්‍ය නායිකා මණ්ඩලය භාර ජ්‍යෙෂ්ඨ ගුරු, අංශ ප්‍රධාන ගුරු සහ ශ්‍රේණි ප්‍රධාන ගුරු යන පාර්ශව තුනෙන් සමන්විත වී ඇත. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අදාළ අයදුම්කාර ශිෂ්‍යාවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම ලේඛනය විදුහල්පතිතුමිය වෙත යොමු කර ඇති අතර, විදුහල්පතිතුමිය විසින් ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා දරුවන් තෝරාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ ලකුණු පාසල් කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. කළමනාකරණ මණ්ඩලය විසින් එම ලේඛණය පරීක්ෂා කර ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා සුදුස්සන් 2023.12.15 දින තීරණය කර එකී තීරණය ප්‍රකාරව කටයුතු සිදුකෙරෙමින් පැවතී ඇත. නව විදුහල්පතිතුමිය විසින් එම තත්ත්වය නොසළකා 2024.03.15 දින ශිෂ්‍ය නායිකාවන් තෝරා ගැනීම සඳහා නව ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව පෙනී යයි. නව විදුහල්පතිනිය පූර්ව ක්‍රියාදාමය නොදැන සිටි බවට කොමිසම හමුවේ ප්‍රකාශ කර ඇතත් පූර්ව වැඩබලන විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සහ අනෙකුත් සාක්ෂි අනුව එය නොදැන සිටියේය යන්න පිළිගැනීමේ හැකියාවක් නොපවතී.

3. වත්මන් විදුහල්පතිනියට පෙර පාසලේ වැඩ බලන විදුහල්පතිනිය වශයෙන් කටයුතු කළ විදුහල්පතිනියගේ කරුණු දැක්වීම අනුව එම සම්මුඛ පරීක්ෂණ සිදුවෙමින් පවතින කාල සීමාව තුළ එනම්, 2024.02.28 දින වත්මන් විදුහල්පතිනිය රාජකාරී භාරගෙන ඇත.

4. පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා යෝජනා වී තිබෙන දරුවන් සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ විරෝධතා එල්ල වූ බැවින් ඡන්ද විමසීමකට යොමුවූ බවට වගඋත්තර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති නමුත් එම විරෝධතා ලිඛිතව ඉදිරිපත්ව නොමැති බව නිරීක්ෂණය වේ.

5. පාසලේ එතෙක් පැවති සම්ප්‍රදාය අනුව ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා දරුවන් තෝරා ගැනීමේදී, සම්මුඛ පරීක්ෂණයෙන් වැඩි ලකුණු ලබාගන්නා සියලු දරුවන් ඡන්ද විමසීමකට ඉදිරිපත් නොකරන බවත්, ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා තේරී පත්වන දරුවන් හැර අනෙකුත් දරුවන් පමණක් ඡන්ද විමසීමට ඉදිරිපත් කරන බවත්, ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය විද්‍යාලීය කළමනාකරණ කමිටුව මඟින් සම්මත කරගන්නා බවත් පැමිණිලි පාර්ශවය සහ පාසලේ හිටපු වැඩ බලන විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන ලද කරුණු මඟින් වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

6. 2023.12.15 දිනැති විද්‍යාලීය කළමනාකරණ කමිටු වාර්තාව අනුව, පැමිණිලිකාරියගේ දියණිය වන සෙතිනි අහමංසා ජයසේකර ශිෂ්‍යාව ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුර සඳහා පත්කිරීමට ඒකමතිකව සම්මතව ඇති බව නිරීක්ෂණය වේ. එම කළමනාකරණ කමිටුව පාසලේ විදුහල්පතිනිය, නියෝජ්‍ය විදුහල්පතිනියන්, සහකාර විදුහල්පතිනියන්, 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වන අංශ ප්‍රධාන ගුරුභවතුන්, 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වන ශ්‍රේණි ප්‍රධාන ගුරුභවතුන්, පාසල් සංවර්ධන කමිටුවේ භාණ්ඩාගාර යන තැනැත්තන්ගෙන් සැදුම්ලත් කමිටුවකි.

7. කෙසේ නමුත් උක්ත සඳහන් ඡන්ද විමසීම පැවැත්වීමෙන් අනතුරුව වත්මන් විදුහල්පතිතුමිය විද්‍යාලීය කළමනාකරණ කමිටුව විසින් ගෙන තිබූ තීරණ සම්බන්ධව දැනුවත් වූ බවත්, එම තීරණ පිළිබඳව තමාට පෙර වැඩ බලන විදුහල්පතිනිය වශයෙන් කටයුතු කළ විදුහල්පතිනිය විසින් දැනුවත් කර නොතිබූ බවත් ප්‍රකාශ කර ඇත.

8. එහෙත් වත්මන් විදුහල්පතිනියට පෙර පාසලේ වැඩ බලන විදුහල්පතිනිය වශයෙන් කටයුතු කළ විදුහල්පතිනිය විසින් යොමු කර ඇති ලිඛිත කරුණු දැක්වීමට අනුව, විද්‍යාලීය කළමනාකරණ කමිටු තීරණ පිළිබඳව නව විදුහල්පතිතුමිය දැනුවත් කිරීමට කටයුතු කළ නමුත් වත්මන් විදුහල්පතිනිය එම තීරණ පිළිබඳව සැලකිල්ලක් නොදක්වමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

9. වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කර සිටින්නේ පැමිණිලිකාරියගේ දියණිය මේ වන විට අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන බැවින් (මේ වන විට අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වී ඇත) පාසලේ නාම ලේඛනයේ නම සඳහන් වන දියණියකට ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුර ලබාදීම සුදුසු බවට ආචාර්ය මණ්ඩලයේ යෝජනාව වූ බැවින් ඡන්ද විමසීමේදී වැඩිම ඡන්ද ලබාගත් 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් එම තනතුර සඳහා තෝරාගත් බවයි. කෙසේනමුත් එම යෝජනා ලිඛිතව ඉදිරිපත්ව නොමැති බව නිරීක්ෂණය වේ. තවද වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයට ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුර අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන දියණියකට ලබා දීම සුදුසු නොවන නමුත් උප ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුර ලබා දීම සඳහා අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන දියණියක් තෝරාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

10. තවද වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියගේ දියණියගේ විනය සම්බන්ධව විවිධ පාර්ශවයන්ගෙන් පැමිණිලි ලැබුණු බවත්, ඇය whatsapp ඇතුළු සමාජ මාධ්‍ය හැසිරවීමේදී පාසලේ ප්‍රධාන තනතුරකට සුදුසු නොවන ආකාරයට කටයුතු කර ඇති බවත් ය. කෙසේ නමුත් පැමිණිලිකාරියගේ දියණිය විසින් whatsapp හි පළකරන ලද status මගින් පාසලට සැලකිය යුතු මට්ටමක අගතියක් සිදුවන බව පෙනී නොයන බැවින් අවවාද කර වැළැක්වීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය වන අතර, මේ සම්බන්ධව වගඋත්තර පාර්ශවය විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොමැති බවත්, පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තේරී පත්ව සිටින සියලු දරුවන්ගේ විනය සම්බන්ධව පරීක්ෂා කර බැලීම සඳහා වගඋත්තර පාර්ශවය කටයුතු කර නොමැති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

11. වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ශිෂ්‍ය නායක මණ්ඩලය පත්කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාව ප්‍රකාරව අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන දියණියක් ශිෂ්‍ය නායක මණ්ඩලයට පත් කිරීමට හැකියාවක් නොමැති බවයි. කෙසේ නමුත් අදාළ උපදෙස් මාලාව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇත්තේ 2024.03.22 දින වන අතර, විද්‍යාලීය ඡන්ද විමසීම 2024.03.15 දින පවත්වා ශිෂ්‍ය නායිකාවන් තෝරාගෙන ඇති බව නිරීක්ෂණය වේ. තවද ඒකී උපදෙස් මාලාව පැමිණිලිකාරියගේ දියණිය සම්බන්ධයෙන් පමණක් අදාළ වීම ගැටළු සහගත වන අතර උප ප්‍රධාන ශිෂ්‍ය නායිකාව වශයෙන් තේරී පත්ව සිටින දියණිය ද අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන දියණියක් වුවත් එම තනතුරට ඇය තෝරා පත් කර ගැනීමේදී උක්ත උපදෙස් මාලාව පිළිබඳව අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ.

12. ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරා පත් කර ගැනීමේදී පාසල විසින් මේ දක්වා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බවත්, වාචිකව පැවත එන සම්ප්‍රදායන් මත පිහිටා කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

13. පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා සිටින ප්‍රධාන ශිෂ්‍ය නායිකා ධූරය ලබා දීම පාසලේ මින් ඉදිරියට සංස්කෘතියක් බවට පත් නොවී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද සඳහනක් අනුව යම් කිසි කාල සීමාවකට යටත්ව ලබා දීමට පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තර පාර්ශවය එකඟත්වය පළ කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

14. පැමිණිලිකාරිය විසින් මෙම සිදුවීම සම්බන්ධව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද පැමිණිල්ලේ ප්‍රගතිය පිළිබඳව විමසන ලද අතර, එහිදී දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (උපදේශන හා මාර්ගෝපදේශ/විෂය සමගාමී) විසින් 2024.06.27 දිනැති අංක දප/අදෙ/අසං/17 දරණ ලිපිය මඟින් දන්වා ඇත්තේ, ඔවුන් විසින් අනාවරණය කරගෙන ඇති කරුණු අනුව මෙම දියණියට යම් අසාධාරණයක් සිදුව ඇති බව සනාථ වන බවත්, පාසල් පරිපාලනය වෙනස්වීමත් සමඟ වෙනස් කරන ලද තීරණ මෙම ගැටලුවට සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය වන බවත්, ඉදිරියේදී මෙවැනි ගැටලු නැවතත් ඇති නොවීමට සහ දරුවන් සමඟ වගකීමෙන් කටයුතු කිරීමට වගඋත්තර පාසලේ විදුහල්පතිතුමිය ඇතුළු කළමනාකරණ මණ්ඩලය වගබලා ගත යුතු බවත් ය.

<u>නිගමනය</u>

ඉහත සඳහන් නිරීක්ෂණවලට අනුව, වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ දියණිය වන සෙතිනි දහම්සා ජයසේකර ශිෂ්‍යාවට ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර ලබාදීමට කටයුතු නොකිරීම හරහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මඟින් සුරක්ෂිත කර ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

පැමිණිලිකාරියගේ දියණිය වන සෙතිනි දහම්සා ජයසේකර ශිෂ්‍යාවගේ ප්‍රතිරූපයට සිදුවූ හානිය ද සැලකිල්ලට ගනිමින් එක් මාසයක කාලයක් සඳහා ඇයට ප්‍රධාන ශිෂ්‍ය නායක ධූරය ලබාදීමට කටයුතු කළ යුතු අතර, මින් ඉදිරියට ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා දරුවන් පත් කර ගැනීමේදී පාසල විසින් විධිමත් ක්‍රමවේයක් යොදා ගැනීමට පියවර ගත යුතුය.

2024.08.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

| | |
|---|---|
| එල්.ටී.බී. දෙහිදෙණිය, | නිමල් ජී. පුංචිහේවා, |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, | කොමසාරිස්, |
| සභාපති, | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | |

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (1) අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

(2) ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.